# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 අගෝස්තු මස 21 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.36 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උපාලි කොඩිකාර
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කිත්සිරි මංචනායක
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
ගුණසිරි ජයනාත්
චන්ද්‍රසෝම සරණලාල්
ජගත් අංගගේ
ජගත් පී. විතාන
ජනක කුරුප්පු
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂන් පාදුක්ක
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
රජිත හපුආරච්චිගේ
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලිත් එල්ලාවල
ලෙනාඩ් කරුණාරත්න
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සහන් ප්‍රදීප්
සුනිල් වටගල
සුසිල් කිඳෙල්පිටිය
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අමල් සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
උදේන විජේරත්න
උපාලි ගුණරත්න
එස්. කුහවර්දන්
කාමල් කුරුප්පු
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් කුමාර
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නිමල් ආර්. පීරිස්
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
ප්‍රදීප් පෙරේරා
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
ලලන්ත ගුණසේකර
ලලිත් වර්ණකුමාර
විජිත් ප්‍රියන්ත
සලෝචන ගමගේ
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සෙනල් වෙල්ගම
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
ශ්‍රීනාත් පෙරේරා

## 01. **නොපැමිණ සිටීමේ අවසරය :**

*ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාස 02 ක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

## 02. **කාරක සභා වාර්තා :**

2018.08.08 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.50 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 03. **රීති අංක 110 යටතේ යෝජනාව :**

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 110 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුශංගිකව කාර්ය පටිපාටි රීති 14(6), 14(7) (ආ), 19(1), 19(3), 39, 53(2) 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යෝජනා කරමි."*

## 04. **පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"වර්තමාන ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස වූ පනත් කෙටුම්පත මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ, ඊට සම්බන්ධ හෝ එහි පසුවිපාකයක් ලෙස, පීඩාවට පත් තැනැත්තෙකු සඳහා යම් මූල්‍යමය ගෙවීමක් හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ දීම, ස්මාරක සෑදීම හා මියගිය තැනැත්තෙකුගේ අනුස්මරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන සලසන තත්ත්වයක් තුළ මුළුමනින්ම කුරිරු ත්‍රස්තවාදීන්ට වන්දි ගෙවීමේ පසුබිමක් සැකසෙන බැවින් ඒ පිළිබඳව බලවත් අප්‍රසාදය රජයට පළ කරන අතරම, ඊට පනත් කෙටුම්පතේ අදාළ වගන්ති වන 27 (ආ) (I), (අ) ඉවත් කර ඒ වෙනුවට බ්ලූමැන්ඩල්, මීතොටමුල්ල කුණු කඳු කඩා වැටීමෙන්ද, සාලාව අවි ගබඩාව පුපුරා යාමෙන්ද, ගංවතුර ගැලීම් ආදී ව්‍යසනයන්ට ලක් වූ ජනතාවට හා දේපළවලට වන්දි ගෙවීමට හැකි වන ආකාරයේ නෛතික ප්‍රතිපාදන මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටී.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***රීති අංක 110 යටතේ ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට ගරු මන්ත්‍රීවරුන්ට තවදුරටත් ඒ පිළිබඳව දැනුවත් වීමට හා පනත පිළිබඳව වැඩිදුරට අධ්‍යයනය කිරීමට අවශ්‍ය බව ගරු මන්ත්‍රීවරුන් යෝජනා කරන ලදුව, ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට පක්ෂ නායක රැස්වීමක් සඳහා පළාත් සභාව පූ.භා. 11.12 ට තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.37 ට යළිත් රැස් විය.***

***අනතුරුව, ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමට ඉඩ ලබා දෙමින් යෝජනාවට ඊළඟ දින න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතාව ලබා දෙන ලෙස නියෝග කරමින්, පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳ විවාදය ඊළඟ සභාවට කල් තබන ලදී.***

## 05. කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ප්‍රශ්න :

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය.

අ. පළාත් සභා නව ගොඩනැගිල්ලේ සභා ශාලාවේ වීඩියෝ පටිගත කිරීම් හා විකාශන පහසුකම්, නව තාක්ෂණ ඡන්ද සලකුණු කිරීම් හා ශබ්ද විකාශන පද්ධතිය සවි කිරීම ඇතුළු කටයුතු වෙනුවෙන් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද?

ආ. උක්ත ටෙන්ඩරයට අනුව ඉටු කළ යුතු කාර්යයන් මොනවාද?

ඇ. ටෙන්ඩර් මණ්ඩලය නියෝජනය කළ අය කවුරුන්ද?

ඈ. ඉදිරිපත් වූ ආයතන හා මිල ගණන් කවරේද?

ඉ. තෝරා ගනු ලැබුවේ කුමන ආයතනයද?

ඊ. තෝරා ගන්නා ලද ආයතනය ඉදිරිපත් කළ ලංසුවලින් කුමන ස්ථානයද?

උ. එම ආයතනය තෝරා ගැනීමට හේතු කවරේද?

ඌ. උක්ත ආයතන ඉදිරිපත් කළ සුදුසුකම් විස්තර හා මිල ගණන් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සභාගත කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

***ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් එකී ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට සති 02 ක කාලයක් කල් ගන්නා ලදී.***

## 06. කල් තැබීමේ යෝජනාව :

එවලේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 11.40 ට, 2018 සැප්තැම්බර් මස 04 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.08.21
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/21
Minuts 2018.08.21 - Hansard Sectionr